# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2219/43 - 2021 මාර්තු මස 17 වැනි බදාදා - 2021.03.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2019 අංක 23 දරන ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත**

කළමනාකරණ රීති

2019 අංක 23 දරන ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනතේ 7වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය විසින් සාදන ලද රීති.

**ඉංජි. කර්නල් (විශ්‍රාමික) නිශ්ශංක එන්. විජේරත්න,**
ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය,

මහලේකම්/ප්‍රධාන විධායක නිලධාරි.
රතු කුරුස ගොඩනැගිල්ල, 8 වන මහල,
අංක 106, ධර්මපාල මාවත,
කොළඹ - 07,
2020 ජනවාරි 31 වැනි දින.

**රීති**

1. මෙම රීති 2020 ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩල කළමනාකරණ රීති ලෙස හඳුන්වනු ලැබේ.

2. ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධානයන්ට අමතරව, මෙම රීති මගින් විධිවිධාන සලසා ඇති පරිදි මණ්ඩලය කළමනාකරණය කරනු ලැබිය යුතුය, පරිපාලනය කරනු ලැබිය යුතුය.

3. අර්ථ නිරූපණ.

'මණ්ඩලය' යන්නෙන් මෙම පනත මගින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය අදහස් වේ.

'සභාව' යන්නෙන් මෙමගින් සංස්ථාපනය කරනු ලබන සභාවේ තත් කාලයේ සාමාජිකයන් අදහස් වේ.

'සාමාජිකයා' යන්නෙන් ලේඛනයේ නම ඇතුළත් කරනු ලැබ ඇති සභාව විසින් අනුමත කරන ලද කවර හෝ සංස්ථාපිත මණ්ඩලයක් හෝ කවර හෝ තැනැත්තකු අදහස් වේ.

'සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරය' යන්නෙන් සේවකයන් 50 දෙනෙකුට වඩා අඩු හෝ රු. මිලියන 5.0 ට අඩු කොටස් ප්‍රාග්ධනයක් සහිත රු. මිලියන 50 ට අඩු වාර්ෂික පිරිවැටුමක් සහිත කවර හෝ ව්‍යාපාරයක් අදහස් වේ.

'ලේඛනය' යන්නෙන් මෙම රීති මගින් විධිවිධාන සලසා ඇති පරිදි සාමාජිකයන්ගේ ලේඛනය අදහස් වේ.

'මාසය' යන්නෙන් ලිත් මාසයක් අදහස් වේ.

'වර්ෂය' යන්නෙන් ලිත් අවුරුද්ද අදහස් වේ.

'පනත' යන්නෙන් 2019 අංක 23 දරන ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත අදහස් වේ.


1A - PG 5349 — 30 (2021/03)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මෙම රීතීන්හි ඒකවචන සංඛ්‍යාවෙන් හැඟවෙන වචනයන්හි බහුවචන සංඛ්‍යාව ඇතුළත් වේ, පුරුෂ ලිංග හැඟවෙන වචනයන්හි ස්ත්‍රී ලිංග සහ නපුංසක ලිංග සහ ඒවායේ ප්‍රතිලෝම ඇතුළත් වේ.

තැනැත්තන් හැඟවෙන වචනයන්හි ස්වභාවික පුද්ගලයන්, සංස්ථා සහ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩල ඇතුළත් වේ.

මේ යටතේ සාදා ඇති රීති අර්ථ නිරූපණය කිරීමේ පරමාධිකාරය වනුයේ සභාව වන අතර සභාවේ තීරණය අවසානාත්මක සහ අනුගම්‍ය වේ.

4. මෙම රීති ප්‍රකාරව සාමාජිකත්වයට ඇතුළත් කර ගන්නා තැනැත්තන් හැර වෙනත් කිසිදු තැනැත්තකු මණ්ඩලයේ සාමාජිකයකු නොවිය යුතු අතර ඒ අනුව සාමාජික ලේඛනයේ ඇතුළත් කරනු ලැබිය යුතුය.

5. **සාමාජිකත්වය**

(අ) ඉදිකිරීම් කර්මාන්තයට සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වී ඇත්තා වූ ආයතන, සංගම්, විද්‍යාතන, සමාගම්, සංස්ථා හෝ වෙනත් යම් සංස්ථාපිත හෝ සංස්ථාපිත නොකළ පුද්ගල මණ්ඩල සහ ස්වභාවික පුද්ගලයන් මණ්ඩලයේ සාමාජිකයන් වීමට සුදුසුකම් ලබයි.

(ආ) සාමාජිකත්ව කාණ්ඩ අටකි, ඒවා නම් :

**ආයතනික සාමාජිකයන්** - සභාව විසින් ආයතනික සාමාජිකයන් ලෙස ඇතුළත් කරගනු ලබන විද්‍යාතන, ආයතන සහ සංගම්

**ව්‍යවස්ථාපිත මණ්ඩල සාමාජිකයන්** - සභාව විසින් ව්‍යවස්ථාපිත මණ්ඩල සාමාජිකයන් ලෙස ඇතුළත් කර ගනු ලබන රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන

**සංස්ථාපිත සාමාජිකයන්** - සභාව විසින් සංස්ථාපිත සාමාජිකයන් ලෙස ඇතුළත් කර ගනු ලබන සභාව විසින් නිශ්චිතව දක්වා ඇති ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල නිරත සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති යටතේ සංස්ථාගත කරන ලද සහ බහුතර හිමිකාරිත්වය ශ්‍රී ලාංකිකයන් විසින් දරනු ලබන සංස්ථාපිත ආයතන

**විදේශීය සංස්ථාපිත සාමාජිකයන්** - සභාව විසින් විදේශීය සංස්ථාපිත සාමාජිකයන් ලෙස ඇතුළත් කර ගනු ලබන, සභාව විසින් නිශ්චිතව දක්වා ඇති ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල ශ්‍රී ලංකාවේ නිරත සහ ශ්‍රී ලංකාවෙන් පිටත සහ/හෝ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද විදේශීය සංස්ථාපිත ආයතන

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සාමාජිකයන්** - සභාව විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සාමාජිකයන් ලෙස ඇතුළත් කරගනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි සහ සංස්ථාගත කරන ලද මෙම කාණ්ඩය තුළට ගැනෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සංස්ථාපිත සාමාජිකයන්

**තනි පුද්ගල සාමාජිකයන්** - සභාව විසින් තනි පුද්ගල සාමාජිකයන් ලෙස ඇතුලත් කර ගනු ලබන ස්වභාවික පුද්ගලයන්

**ගෞරව සාමාජිකයන්** - රාජ්‍ය තාන්ත්‍රිකත්වයේ, රාජ්‍යෝපායඥානයේ, රාජ්‍ය සේවයේ, ව්‍යාපාරික අංශයේ, සිවිල් සමාජයේ කීර්තිමත් පුද්ගලයන් හෝ ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලයට සුවිශේෂී සේවාවක් සපයා ඇති පුද්ගලයන් සභාවේ අභිමතය පරිදි ගෞරව සාමාජිකයන් ලෙස ඇතුලත් කර ගනු ලැබේ. ගෞරව සාමාජිකයන්ට සභාවට නියෝජිතයන් නම් කිරීමට හෝ තෝරා පත්කර ගැනීමට හෝ මණ්ඩලයේ මහා සභා රැස්වීමේදී ඡන්දය ප්‍රකාශ කිරීමට හෝ අයිතිය නොතිබිය යුතු මුත් කවර හෝ මහා සභා රැස්වීමකට පැමිණීමට සහ කථා කිරීමට අයිතිය ඇත්තේය. එවැනි සාමාජිකයන්ගෙන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි සහනදායී දායක ගාස්තුවක් අය කරනු ලැබිය හැකිය.

**ගෞරව යාවජීව සාමාජිකයන්** - දේශීය ඉදිකිරීම් කර්මාන්තයට කැපී පෙනෙන ආකාරයකින් දායකත්වය ලබා දී ඇති සහ වසර 5කට වැඩි කාලයක් මණ්ඩලයට සැලකිය යුතු සේවාවක් ඉටු කොට ඇති තැනැත්තන් සභාවේ අභිමතය පරිදි ගෞරව යාවජීව සාමාජිකයන් ලෙස ඇතුළත් කර ගනු ලැබේ. ගෞරව යාවජීව සාමාජිකයන්ට සභාවට නියෝජිතයන් නම් කිරීමට හෝ තෝරා පත්කර ගැනීමට හෝ මණ්ඩලයේ මහා සභා රැස්වීමේදී ඡන්දය ප්‍රකාශ කිරීමට හෝ අයිතිය නොතිබිය යුතුය. නමුත් ඔවුනට සභාවට හෝ මහා සභා රැස්වීම්වලට සහභාගිවීමටත්, අනෙකුත් කරුණු සම්බන්ධයෙන් සභාවේ හෝ මහා සභා රැස්වීමේදී ඡන්දය ප්‍රකාශ කිරීමටත්, එම රැස්වීම්වලදී කථා කිරීමටත් හැකිය. එම සාමාජිකයන් දායක ගාස්තුවලින් නිදහස් කරනු ලැබිය යුතුය.

**ඡන්ද නොමැති සාමාජිකයන්** - සභාව විසින් ඡන්ද නොමැති සාමාජිකයන් ලෙස ඇතුළත් කර ගනු ලබන පුද්ගල මණ්ඩල, සංස්ථාපිත හෝ සංස්ථාගත කළ සහ ස්වභාවික පුද්ගලයන්. එම සාමාජිකයන්ට ඡන්ද බලය නොමැති අතර සභාව විසින් නිශ්චය කරනු ලබන සහනදායී දායක ගාස්තුවක් අයකිරීමට හැකිය.

(ඇ) මණ්ඩලයේ සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීම සඳහා වන නිර්ණායකයන්ට අදාළව සභාව නීති පැනවිය හැකි අතර සාමාජිකත්වය සඳහා වන අයදුම්පත්‍ර එම නීතිවල නිර්දේශිත ආකෘතියෙන් විය යුතුය.

(ඈ) ඉහත සඳහන් රීති මත පදනම්ව එම අයදුම්පත්‍ර සම්බන්ධයෙන් සභාව තීරණය කළ යුතු අතර සභාවේ කවර හෝ තීරණයන් අවසානාත්මක හා තීරණාත්මක විය යුතුය.

(ඉ) මෙහි මීට පටහැණිව කුමක් සඳහන් වුවද, පනත් මගින් සංස්ථාපිත කිරීමට පූර්වයෙන් සිටි මණ්ඩලයේ සාමාජිකයන්, මණ්ඩලයේ සාමාජිකයන් ලෙස සැලකිය යුතු අතර එම සාමාජිකයන් විසින් දරනු ලබන සාමාජිකත්ව කාණ්ඩයට අදාළ අයිතිවාසිකම් හා වරප්‍රසාද ක්‍රියාත්මක කිරීම හා භුක්ති විඳීම කළ හැකි අතර රීතිවල සහ පනතේ අන්තර්ගත අනුරූපී බැඳීම්වලට යටත් විය යුතුය.

6. **සාමාජිකත්වය අවසන් කිරීම**

(i) පහත දැක්වෙන කවර හෝ හේතුවක් නිසාවෙන් සාමාජිකයකු, එනයින්ම සාමාජිකයකු වීම අවසන් විය යුතුය.

(අ) සාමාජිකයකු බුන්වත්යැයි විනිශ්චය කළහොත් හෝ ගෙවීම් අත්හිටුවුවහොත් හෝ ණය හිමියන් සමග සමථයකට එළඹියහොත් ;

(ආ) නියමිත දිනට පෙර වාර්ෂික දායකමුදල ගෙවීම පැහැර හැරියහොත් හෝ මණ්ඩලයට ගෙවිය යුතු වෙනත් යම් මුදලක් ගෙවීම දීගින් දිගටම පැහැර හැරියොත් හෝ ප්‍රතික්ෂේප කළහොත්. කෙසේවෙතත්, දායක මුදල හෝ ගෙවීමට ඇති වෙනත් මුදලක් හිග මුදල් සමග ගෙවීම මත, සභාවේ යෝජනා සම්මතයකින් ඔහු නැවත සාමාජිකත්වයට ඇතුළත් කර ගත හැකිය.

(ඇ) සාමාජිකයකු පනතේ හෝ මණ්ඩලයේ රීතිවල යම් විධිවිධානවලට අනුව කටයුතු කිරීම පැහැර හැරියහොත්, මහා ලේකම්/ප්‍රධාන විධායක නිලධාරී හරහා සභාව ලියාපදිංචි ලිපියක් මගින් එසේ කටයුතු කරන ලෙස ඔහුට දැනුම් දී සති දෙකක් ඇතුළත

(ii) මහා ලේකම්/ප්‍රධාන විධායක නිලධාරී වෙත ලිඛිතව එක් ලිත් මාසයක දැනුම්දීමක් මගින් ඕනෑම සාමාජිකයකුට ඉල්ලා අස්විය හැකිය. නමුත් ඔහු යම් ලිත් වර්ෂයක ජනවාරි මස පළමු දිනය හෝ ජූනි මස 30 වන දිනය අතර, එම දින දෙකද ඇතුළුව, දිනයක ඉල්ලා අස්වුවහොත් එම සාමාජිකයා වාර්ෂික දායක මුදලින් අඩක් ගෙවීමට බැඳී සිටියි, යම් ලිත් වර්ෂයක ජූනි මස 30 වන දිනයෙන් පසුව ඔහු ඉල්ලා අස්වුව හොත් වාර්ෂික දායක මුදලේ මුළු මුදල ගෙවීමට ඔහු බැඳී සිටියි.

(iii) 14 (ආ)(ii) වගන්තිය ප්‍රකාරව සාමාජිකයන්ගේ ඉල්ලීම මත නිශ්චිත කාර්යය සඳහා කැඳවනු ලැබූ මණ්ඩලයේ අති විශේෂ මහා සභා රැස්වීමකදී, පැමිණ සිටින සහ එහිදී ඡන්දය ප්‍රකාශ කරන සාමාජිකයන්ගේ ප්‍රතියුක්ත දරන්නන්, හෝ තනි තනි සාමාජිකයන් සම්බන්ධයෙන් වන විටදී එම සාමාජිකයන් විසින් පුද්ගලිකව හෝ ඔවුන්ගේ ප්‍රතියුක්තකයන් මගින් සම්මත කර ගනු ලබන යෝජනා සම්මතයක් මගින්, තම පැවැත්මෙන් තමන් මණ්ඩලයේ සාමාජිකයකු වීමට නුසුදුසු තත්ත්වයට පත්ව ඇති හෝ එම සාමාජිකයාගේ ක්‍රියාමාර්ග මණ්ඩලයේ යහපතට අගතිගාමී වන විටදී, කවර හෝ සාමාජිකයකු නෙරපා හැරිය හැකිය. එසේ නෙරපා හරිනු ලැබූ යම් සාමාජිකයකු ඉන් අනතුරුව සාමාජිකයකු වීම අවසන් වන්නේය. මෙම වගන්තියේ කාර්යය සඳහා, මේ සඳහා වන යෝජනා සම්මතයක් සම්මත වීම සහ එම රැස්වීමේ කාර්ය සටහන්වල එය වාර්තාවීම සහ මණ්ඩලයේ සභාපති සහ මහා ලේකම්/ප්‍රධාන විධායක නිලධාරියා විසින් සහතික කරනු ලැබීම ප්‍රමාණවත් වන්නේය.

(iv) බහුතර තීරණය මගින් සභාව, එහි මතය අනුව තම පැවැත්ම මගින් තමන් මණ්ඩලයේ සාමාජිකයකු වීමට නුසුදුසු බවට පත්ව ඇති කවර හෝ සාමාජිකයකු අත්හිටුවා එම සාමාජිකයා නෙරපා හැරීම අතිවිශේෂ මහා සභා රැස්වීමකට නිර්දේශ කළ හැකිය. සභාව විසින් එවැනි තීරණයක් ගැනීමෙන් පසුව දින 21 කට නොඅඩු කාල සීමාවක් තුළ දිනයකදී, මහා ලේකම්/ ප්‍රධාන විධායක නිලධාරී විසින් එම නිර්දේශය සලකා බැලීම සඳහා අති විශේෂ මහා සභා රැස්වීමක් කැඳවනු ලැබිය යුතුය. පැමිණ සිටින සහ ඡන්දය ප්‍රකාශ කරන සාමාජිකයන්ගේ ප්‍රතියුක්තකයන් සහ තනි තනි සාමාජිකයන් සම්බන්ධයෙන් වන විටදී එම සාමාජිකයන් විසින් පුද්ගලිකව හෝ ඔවුන්ගේ ප්‍රතියුක්තකයන් මගින් සම්මත කර ගනු ලබන යෝජනා සම්මතයක් මගින් සභාව අදාළ සාමාජිකයා නෙරපිය හැකිය. එසේ නෙරපා හරිනු ලැබූ යම් සාමාජිකයකු ඉන් අනතුරුව සාමාජිකයකු වීම අවසන් වන්නේය.

(v) මෙම වගන්තිය ප්‍රකාරව සාමාජිකත්වය අත්හිටුවා ඇති විටදී හෝ සාමාජිකත්වය අවසන් කර ඇති විටදී, එනයින්ම සාමාජිකත්වයට සබැඳි සියලු හිමිකම් අවසන් වන්නේය.

7. **ගාස්තු**

(අ) බඳවාගැනීමේ ගාස්තු
සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලබන පරිදි සෑම සාමාජිකයකුගෙන්ම බඳවා ගැනීමේ ගාස්තු අයකර ගත යුතුය.

(ආ) දායක ගාස්තු

සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලබන පරිදි සෑම සාමාජිකයකුගෙන්ම ලිත් වර්ෂය පදනම්ව වාර්ෂික දායක ගාස්තුවක් අයකළ යුතුය. සාමාජිකයන් කවර හෝ එක් වසරක් සඳහා වාර්ෂික දායක ගාස්තුව, මණ්ඩලය විසින් දැනුම් දෙන පරිදි, වසරේ මුල් මාස තුන තුළ ගෙවිය යුතුය. දායක මුදල් හිඟ හිටි ඇති යම් සාමාජිකයකුගේ නියෝජිතයන් හට, එම වර්ෂය සඳහා දායක ගාස්තු වර්ෂයේ මුල් මාස තුන තුළ ලැබී ඇත්තේනම් මිස සභාවේ, මණ්ඩලයේ, ස්ථාවර කමිටුවේ හෝ වෙනත් යම් කමිටුවක කිසිදු රැස්වීමකට පැමිණීමට හෝ සහභාගිවීමට හෝ හිමිකම් නොමැති අතර මණ්ඩලයේ නිලධාරියකු ලෙස කටයුතු කිරීමට හෝ අවස්ථාවෝචිත පරිදි එහි සභාවේ හෝ ස්ථාවර කමිටුවේ හෝ වෙනත් යම් කමිටුවක සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීමට ද නොහැක්කේය.

(ඇ) බඳවා ගැනීමේදී, මණ්ඩලයට ඇතුළත් කර ගන්නා සාමාජිකයන් බඳවා ගැනීමේ ගාස්තු සහ එක් වසරක දායක ගාස්තු ගෙවිය යුතුය. පළමු වසර සම්පූර්ණ වීමේදී, අදාළ වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සාමාජිකත්වය අළුත් කර ගැනීම පිණිස, එවැනි සමාජිකයන් අනුපාතික දායක ගාස්තුවක් ගෙවිය යුතුය. ඉන් අනතුරුව, සෑම වසරකම ජනවාරි මස පළමුවන දා සිට වාර්ෂික දායක ගාස්තු ගෙවිය යුතුය.

(ඈ) සාමාජිකයන්ගෙන් අයකර ගනු ලබන බඳවා ගැනීම් ගාස්තුව සහ වාර්ෂික දායක ගාස්තුව සභාව කලින් කලට වෙනස් කිරීමට හැකි අතර වෙනත් යම් ගාස්තුවක් ද මණ්ඩලයේ යහපත වෙනුවෙන් කලින් කල වෙනස් කිරීමට හැකිය.

8. **සභාවේ සාමාජිකයන්ගේ නියෝජිතයන්**

(අ) ආයතනික සාමාජිකයන්

(i) එක් එක් ආයතනික සාමාජිකයකුට එක් (01) නියෝජිතයකු සභාවට නම් කිරීමට හිමිකම ඇති අතර ඔහුට ඡන්ද අයිතිය ඇති අතර එසේ නම් කළ තැනැත්තන් ඊළඟ වසරේ වාර්ෂික මහා සභා රැස්වීමේ අවසානය දක්වා ධූරය දැරිය යුතුය.

(ii) අදාළ ආයතනික සාමාජිකයාට නියෝජිතයා නම් කිරීම ඕනෑම අවස්ථාවක අහෝසි කර වෙනත් අයෙකු ඒ වෙනුවෙන් පත්කරනු ලැබිය හැකි නමුත් එවැනි වෙනත් තැනැත්තා ද අදාළ ආයතනික සාමජිකයාගේ පාලන මණ්ඩලයේ සාමාජිකයෙකු විය යුතුය.

(iii) සභාවේ ඕනෑම රැස්වීමකදී, එක් එක් ආයතනික සාමාජිකයාගේ නියෝජිතයන් සංඛ්‍යාව කොපමණද යන්න නොසලකා, එක් එක් ආයතනික සාමාජිකයාට හිමිකම ඇත්තේ රැස්වීමට පැමිණ සිටින සිය නියෝජිතයන් මගින් එක් ඡන්දයක් ප්‍රකාශ කිරීමට පමණි.

(iv) ශ්‍රී ලංකාවේ නොසිටීම, අසනීප තත්ත්වය හෝ තම නොපැමිණීම සාධාරණීකරණය කළ හැකි වෙනත් යම් හේතුවක් නිසාවෙන් සාමාජිකයකුගේ නියෝජිතයකුට යම් රැස්වීමකට සහභාගි වීමට නොහැකි නම්, සභාවේ එම රැස්වීම සඳහා සහභාගි වීමට පාලන මණ්ඩලයේ සාමාජිකයකු වන්නා වූ වෙනත් නියෝජිතයකු නම් කිරීමට සහ ඔහු නොපැමිණෙන කාලය තුළ සියලු කරුණු සම්බන්ධයෙන් ඔහු වෙනුවෙන් කටයුතු කිරීමට එම නියෝජිතයාට හිමිකම තිබිය යුතුය.

(ආ) එක්ව ක්‍රියාකරන සියලු ව්‍යවස්ථාපිත නියෝජිතායතන සාමාජිකයන්ට ඔවුන්ගේ සාමූහික අභිලාෂයන් නියෝජනය කරනු පිණිස නියෝජිතයන් හතර (04) දෙනෙකු සභාවට තෝරා පත් කර ගැනීමට හිමිකම තිබිය යුතු අතර තෝරා පත් කර ගනු ලැබූ එම නියෝජිතයන්ට එක් එක් ඡන්දය බැගින් තිබිය යුතුය.

(ඇ) එක්ව ක්‍රියාකරන සියලු සංස්ථාපිත නියෝජිතායතන සාමාජිකයන්ට ඔවුන්ගේ සාමූහික අභිලාෂයන් නියෝජනය කරනු පිණිස නියෝජිතයන් අට (08) දෙනෙකු සභාවට තෝරා පත් කර ගැනීමට හිමිකම තිබිය යුතු අතර තෝරා පත් කර ගනු ලැබූ එම නියෝජිතයන්ට එක් එක් ඡන්දය බැගින් තිබිය යුතුය.

(ඈ) එක්ව ක්‍රියාකරන සියලු විදේශීය සංස්ථාපිත නියෝජිතායතන සාමාජිකයන්ට ඔවුන්ගේ සාමූහික අභිලාෂයන් නියෝජනය කරනු පිණිස එක් (01) නියෝජිතයකු සභාවට තෝරා පත් කර ගැනීමට හිමිකම තිබිය යුතු අතර තෝරා පත් කර ගනු ලැබූ එම නියෝජිතයාට එක් ඡන්දයක් තිබිය යුතුය.

(ඉ) එක්ව ක්‍රියාකරන සියලු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සාමාජිකයන්ට ඔවුන්ගේ සාමූහික අභිලාෂයන් නියෝජනය කරනු පිණිස, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් විසි පස් දෙනෙකුට (25) එක් නියෝජිතයකු බැගින් නියෝජිතයන් දෙදෙනකු (02) දක්වා සභාවට තෝරා පත් කර ගැනීමට හිමිකම තිබිය යුතු අතර තෝරා පත් කර ගනු ලැබූ එම නියෝජිතයන්ට එක් එක් ඡන්දය බැගින් තිබිය යුතුය.

(ඊ) එක්ව ක්‍රියාකරන සියලු තනි පුද්ගල සාමාජිකයන්ට ඔවුන්ගේ සාමූහික අභිලාෂයන් නියෝජනය කරනු පිණිස එක් (01) නියෝජිතයකු සභාවට තෝරා පත් කර ගැනීමට හිමිකම තිබිය යුතු අතර තෝරා පත් කර ගනු ලැබූ එම නියෝජිතයාට එක් ඡන්දයක් තිබිය යුතුය.

(එ) ඉහත (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ) හි සඳහන් කරනු ලැබ ඇති එක් එක් නියෝජිතයන්ට සභාවේ රැස්වීමකදී එක් ඡන්දයකට හිමිකම් තිබිය යුතුය.

මෙම පනත මගින් සංස්ථාගත කිරීමට පෙර සභාවේ සාමාජිකයන්, මෙම පනත මගින් සංස්ථාගත කිරීමෙන් අනතුරුව පැවැත්වෙන පළමු වාර්ෂික මහා සභා රැස්වීමේ අවසානය දක්වා ධූර දැරිය යුතු නමුත් සුදුස්සන් වන හෙයින් නැවත තෝරා පත්කර ගැනීම සඳහා ඉදිරිපත් විය හැකිය. ඉන් අනතුරුව, එකී නියෝජිතයන් ඊළඟ වර්ෂයේ වාර්ෂික මහා සභා රැස්වීමේ අවසානය දක්වා ධූර දැරිය යුතුය. මෙම නියෝජිතයන්ගේ ධූර කාලය තුළදී ධූරයන්හි හි ඇතිවන යම් ඇබෑර්තුවක් අදාළ සාමාජිකත්ව කාණ්ඩයේ නියෝජිතයන් අතුරින් සභාව විසිනු පුරවනු ලැබිය යුතු අතර එසේ ඇබෑර්තුව පුරවන තැනැත්තා ඊ ළඟ වාර්ෂික මහා සභාවේ අවසානය දක්වා ධූරය දැරිය යුතුය.

**9. සභාව**

(අ) මණ්ඩලයේ සියලු ප්‍රතිපත්ති තීරණ සම්පාදනය සඳහා සහ විධායක කර්තව්‍ය මහා ලේකම්/ ප්‍රධාන විධායක නිලධාරියාට පැවරීම සඳහා සභාව වගකිව යුතුය.

(ආ) සභාව පහත දැක්වෙන අයගෙන් සමන්විත විය යුතුය.

(i) සභාවේ හෝ වෙනත් යම් රැස්වීමක එක් ඡන්දයක් හිමි සභාපති, තෝරා ගෙන ඇති මීලග සභාපති, නියෝජ්‍ය සභාපතිවරු හතර දෙනෙකු, ආසන්නතම හිටපු සභාපති සහ සභාපති විසින් නම් කළ උප සභාපතිගෙන් සමන්විත ධූර දරන්නන් අට (08) දෙනෙකු ;

(ii) 8 වන වගන්තිය ප්‍රකාරව පත්කරනු ලැබූ මණ්ඩලයේ සමාජිකයන්ගේ නියෝජිතයන් ;

(iii) අවශ්‍ය පරිදි හා අවශ්‍ය විටදී සභාපති විසින් සාමාජික සංගම්වලින් හෝ සංස්ථාපිත අංශයෙන් හෝ මණ්ඩලයට දායකත්වය දැක්විය හැකි වෙනත් යම් විශේෂ ආරාධිත පුද්ගලයන් දස (10) දෙනෙකු නම් කරනු ලැබිය හැකිය. එසේ නම්කරනු ලැබූ තැනැත්තන් ඊ ළඟ වර්ෂයේ වාර්ෂික මහා සභා රැස්වීමේ අවසානය දක්වා ධූර දැරිය යුතු අතර ඔවුනට ඡන්ද බලය හිමි නොවන අතර අවශ්‍ය වුවහොත් නැවත පත් කරනු ලැබිය හැකිය.

(iv) එසේ වුවද, සාමාජිකයකුගේ යම් නියෝජිතයකු ධූර දරන්නනෙකු ලෙස කටයුතු කිරීම හෝ ධූර දරන්නකු වීම කිසිවකින් හෝ වළවක්වනු නොලැබිය යුතුය. එමෙන්ම, මණ්ඩලයේ සභාපති නම් කළ තැනැත්තන් සම්බන්ධයෙන් ගත් කළ, කවර හෝ අවස්ථාවක එම නම් කිරීම ඉවත් කර ඇතිවන පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු ලියවිල්ලකින් පත්කිරීමට සභාපතිට හැකිය.

(ඇ) ව්‍යවස්ථාපිත නියෝජිතායතන සාමාජිකයන්ගේ, සංස්ථාපිත සාමාජිකයන්ගේ, විදේශීය සංස්ථාපිත සාමාජිකයන්ගේ, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සාමාජිකයන්ගේ සහ තනි පුද්ගල සාමාජිකයන්ගේ නියෝජිතයන්ගේ නාමයෝජනා ලබා ගැනීම සහ තෝරා පත්කර ගැනීම සඳහා පහත දැක්වෙන පරිපාටිය අදාළ විය යුතුය.

(i) ව්‍යවස්ථාපිත නියෝජිතායතන සාමාජිකයන්ගේ, සංස්ථාපිත සාමාජිකයන්ගේ, විදේශීය සංස්ථාපිත සාමාජිකයන්ගේ, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සාමාජිකයන්ගේ සහ තනි පුද්ගල සාමාජිකයන්ගේ නියෝජිතයන් තෝරා පත්කර ගැනීම පිණිස මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් නාමායෝජනා ලබා ගැනීම සඳහා වාර්ෂික මහා සභාවේ රැස්වීමට සති දෙකකට පෙර දිනයක් මහාලේකම්/ ප්‍රධාන විධායක නිලධාරියා නියම කළ යුතුය.

(ii) ව්‍යවස්ථාපිත නියෝජිතායතන සාමාජිකයන්ගේ, සංස්ථාපිත සාමාජිකයන්ගේ, විදේශීය සංස්ථාපිත සාමාජිකයන්ගේ, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සාමාජිකයන්ගේ සහ තනි පුද්ගල සාමාජිකයන්ගේ නියෝජිතයන්ගේ නම් කළ තැනැත්තන් සඳහා අත්සන්කරුවන් තිදෙනෙකු අවශ්‍ය වනු ඇත, එක (1) ඔහුගේ ආයතනයේ/සංගමයේ/සංස්ථාපිත ආයතනයේ අත්සන්කරු සහ දෙක (2) අනෙකුත් ආයතනික ව්‍යවස්ථාපිත නියෝජිතායතන හෝ සංස්ථාපිත සාමාජිකයන්ගෙන් අත්සන්කරුවන් දෙදෙනෙක්

(iii) නම් කරන ලද පුද්ගලයන්, තමන්ගේ එම නාමයෝජනා කිරීම් පිළිගැනීම මහා ලේකම්/ප්‍රධාන විධායක නිලධාරී වෙත ලිඛිතව සන්නිවේදනය කළ යුතුය.

(iv) වාර්ෂික මහා සභාව කැඳවීමේ නිවේදනය සමගින් නම්වල අකරාදී අනුපිළිවෙළට සකස් කරනු ලැබූ සහ එක් එක් ධූරය යටතේ ලැයිස්තු ගත කළ විධිමත් පරිදි ලැබුණු නාමයෝජනා පිළිබඳ ප්‍රකාශනයක් අඩංගු දැන්වීමක් මහා ලේකම්/ ප්‍රධාන විධායක නිලධාරී විසින් සාමාජිකයන්ට නිකුත් කරනු ලැබිය යුතුය.

(v) ව්‍යවස්ථාපිත නියෝජිතායතන සාමාජිකයන්ගේ, සංස්ථාපිත සාමාජිකයන්ගේ, විදේශීය සංස්ථාපිත සාමාජිකයන්ගේ, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සාමාජිකයන්ගේ සහ තනි පුද්ගල සාමාජිකයන්ගේ නියෝජිතයන් රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ පෙරකලාසි දරන්නන්ගේ බහුතර ඡන්දයෙන් තෝරා පත් කර ගත යුතුය.

(vi) වාර්ෂික මහා සභා රැස්වීමේදී, සභාපති සහ මහා ලේකම්/ප්‍රධාන විධායක නිලධාරී හෝ සභාවේ සාමාජිකයන් අතුරින් සභාව විසින් පත්කරනු ලැබූ වෙනත් පරීක්ෂකවරුන් දෙදෙනෙකු ඡන්ද පත්‍රිකා පරීක්ෂා කළ යුතු අතර බහුතර ඡන්දය මත එසේ තෝරා පත් කරගත් තැනැත්තන් සභාපතිවරයා රැස්වීමේදී නිවේදනය කළ යුතුය.

(vii) තෝරා පත්කරගත් යම් තැනැත්තකු ධූරය භාරගැනීම ප්‍රතික්ෂේප කළහොත්, ඊළඟට වැඩිම ඡන්ද ලබාගෙන ඇති තැනැත්තා තේරී පත්වූ සේ සැලකිය යුතුය.

(viii) ඉහත දැක්වූ පරිදි පත්කර ගනු ලැබූ නියෝජිතයන් ඊළඟ වසරේ වාර්ෂික මහා සභාව අවසානය දක්වා ධූරය දැරිය යුතුය.

(ඈ) ආයතනික සාමාජිකයන් සභාවට තමන් නම්කළ තැනැත්තන් වාර්ෂික මහා සභාව අවසන් වී සති තුනක් ඇතුළත ලියවිල්ලක් මගින් මහාලේකම්/ ප්‍රධාන විධායක නිලධාරියාට දැනුම් දිය යුතුය. ඉහත සඳහන් පරිදි නම් කළ නියෝජිතයන් ඊළඟ වසරේ වාර්ෂික මහා සභාව අවසානය දක්වා ධූරය දැරිය යුතුය.

**10. කළමනාකරණ මණ්ඩලය**

(අ) කළමනාකරණ මණ්ඩලය විසින් මණ්ඩලයේ කටයුතු, කළමනාකරණය හා පරිපාලනය කළ යුතු අතර මෙම රීති මගින් හෝ පනත මගින් සභාවේ අනුමැතිය හෝ මහා සභා රැස්වීමක අනුමැතිය සහිතව මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුතු බවට නියම කර ඇති බලතල හැර මණ්ඩලයේ අන් සියලු බලතල ක්‍රියාත්මක කළ යුතුය.

(ආ) පනතින් සංස්ථාගත කිරීමට පෙර සිටි කළමනාකරණ මණ්ඩලය (එකල හැඳින්වූ අධ්‍යක්ෂක මණ්ඩලය) පනතින් සංස්ථාගත කිරීමෙන් පසුව පැවැත්වීමට නියමිත පළමු මහා සභා රැස්වීමෙන් පසුව පවත්වන පළමු සභා රැස්වීම දක්වා ධූර දැරිය යුතුය. මෙම ධූර දරන්නන් සුදුස්සන් වන හෙයින්, ඉන් අනතුරුව ද සභාවේ සාමාජිකයන් විසින් කළමනාකරණ මණ්ඩලයට නැවත තෝරා පත්කර ගත හැකිය.

(ඇ) කළමනාකරණ මණ්ඩලය පහත දැක්වෙන ධූර දරන්නන් 9 දෙනාගෙන් සමන්විත විය යුතුය.

(i) සභාපති

(ii) තෝරා ගෙන ඇති මීලග සභාපති

(iiii) නියෝජ්‍ය සභාපතිවරුන් හතර දෙනා

(iv) ආසන්නතම පසුගිය සභාපති

(v) සභාපති විසින් නම්කරනු ලැබූ නියෝජ්‍ය සභාපති

(vi) මහා ලේකම්/ ප්‍රධාන විධායක නිලධාරී

(ඈ) සභාපතිගේ ආරාධනයෙන් සභාවට තෝරා පත්කර ගනු ලැබූ සභාවේ සාමාජිකයන් දස (10) දෙනා අතුරින් කළමනාකරණ මණ්ඩලයේ සහ සභාවේ කටයුතු කිරීම පිණිස නම්කරනු ලැබූ උප සභාපතිවරයකු සිටිය යුතුය. එම උප සභාපතිවරයා එක් ඡන්දයකට හිමිකම ඇත.

(ඉ) සභාපතිගේ විශ්‍රාම යාමේදී හෝ ධූරය අත්හැරීමේ දී ඡන්ද විමසීමකින් තොරව මීලග සභාපති ලෙස තෝරා ගෙන ඇති අය සභාපති ලෙස පත් කළ යුතුය. ව්‍යවස්ථාපිත සංස්ථාගත කිරීමෙන් පසුව, සභාපතිගේ ධූර කාලය එක් වාරයකට ආසන්න වශයෙන් වසරක් වන මුළු වාර තුනකට සීමා විය යුතුය. එක් "වාරයක්" අනුගාමී වාර්ෂික මහා සභා රැස්වීම් දෙකකට පසු පැවති ආසන්නතම පළමු සභා රැස්වීම් දෙක අතර කාල සීමාව විය යුතු අතර එම කාල සීමාව ආසන්න වශයෙන් එක් වසරක් වනු ඇත.

(ඊ) ධූර කාලය අතරතුර ඇබෑර්තු වන සභාපතිගේ ධූරය, මහා ලේකම්/ප්‍රධාන විධායක නිලධාරී විසින් කැඳවනු ලබන විශේෂ සභා රැස්වීමක දී ඡන්ද විමසීමකින් තොරව තෝරා ගෙන ඇති මීලඟ සභාපති විසින් පිරවිය යුතුය.

(උ) තෝරා ගෙන ඇති මීලග සභාපති, වාර්ෂික මහා සභා රැස්වීමෙන් පසු පළමු රැස්වීමේදී සංස්ථාපිත සභාව විසින් බහුතර කැමැත්ත මත තෝරා ගත යුතුය. එකී තෝරාගෙන ඇති මීලග සභාපති වසර දෙකකට නොඅඩු කාලයක් සඳහා උප සභාපතිවරයකු ලෙස සභාවට සේවය සැපයූ අයකු විය යුතු අතර තේරී පත්වීමෙන් පසුව ඔහු සභාපති ලෙස පත්කරනු ලබන තෙක් ඡන්ද විමසීමකින් තොරව ධූරය දිගටම දැරිය යුතුය.

(ඌ) ධූර කාලය අතරතුර ඇතිවන තෝරාගත් මීලග සභාපතිගේ ධූරයේ යම් ඇබෑර්තුවක්, අදාළ කාර්යය සඳහා කැඳවනු ලබන සභාවේ විශේෂ රැස්වීමකදී බහුතරයේ කැමැත්ත මත පිරවිය යුතු අතර ඒ සඳහා 10(උ) වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ කරගත යුතුය.

(එ) සභාපති සහ තෝරා ගෙන ඇති මීලග සභාපති 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 26 වන වගන්තිය යටතේ පිළිගත් සුදුසුකම් ලැබූ තැනැත්තන් හෝ නීති සහ ගණකාධිකරණ ක්ෂේත්‍රයන්හි පූර්ණ වෘත්තීය සුදුස්කම් ලත් තැනැත්තන් විය යුතුය.

(ඒ) ධූර දරන්නන් සඳහා නාමයෝජනා ලබා ගැනීම සහ තෝරා ගැනීම සඳහා පහත දැක්වෙන පටිපාටිය අදාළ කර ගත යුතුය.

(i) වාර්ෂික මහා සභා රැස්වීමෙන් පසු සති හතරකට නොඅඩු කාලයක් තුළ පැවැත්වීමට නියමිත පළමු සභා රැස්වීමේදී ධූර දරන්නන් පත් කළ යුතුය.

(ii) උප සභාපතිවරුන් හතර දෙනා තෝරා ගැනීම සඳහා මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් නාමයෝජනා ලබාගැනීම සඳහා වාර්ෂික මහා සභා රැස්වීමෙන් සති දෙකකට නොඅඩු දිනයක් මහා ලේකම්/ප්‍රධාන විධායක නිලධාරී විසින් නියම කරනු ලැබිය යුතුය.

(iii) ආයතනික සාමාජිකයන්ගෙන් නියෝජිතයන් දෙදෙනෙකු සහ එක්ව ක්‍රියාකරන ව්‍යවස්ථාපිත නියෝජිත ආයතන, සංස්ථාපිත, විදේශීය සංස්ථාපිත හෝ සු.ම.ප. සමාජිකයන්ගෙන් එක් අයකු උප සභාපතිවරුන් සඳහා නාමයෝජනාවන්ට අනුග්‍රාහකත්වය දැරිය යුතුය.

(iv) ඡන්ද අයිතිය ඇති සභා සාමාජිකයන්ගේ බහුතර කැමැත්ත මත, උප සභාපතිවරුන් හතර දෙනා වාර්ෂික මහා සභා රැස්වීමෙන් පසු පළමු රැස්වීමේදී සංස්ථාපනය කරනු ලැබූ සභාව විසින් වාර්ෂිකව පත් කර ගත යුතුය. උප සභාපතිවරුන් පත් කර ගත යුත්තේ වරකට එක් වාරයක් සඳහා පමණි. එක් "වාරයක්" විය යුත්තේ ආසන්න වශයෙන් එක් වසරක කාල සීමාවක් වන අනුගාමී වාර්ෂික මහා සභා රැස්වීම් දෙකකින් පසු ආසන්නතම පළමු සභා රැස්වීම් අතර කාල සීමාවයි. උප සභාපතිවරයකු ලෙස තෝරා ගැනීම සඳහා සුදුසුකම් ලැබීමට නම් යම් සභා සාමාජිකයකු යටත් පිරිසෙයින් වසර දෙකක් සඳහා සභාවට සේවය කර තිබිය යුතුය.

(v) ඉවත්ව යන කළමනාකරණ මණ්ඩලයේ ධූර දැරූ උපසභාපතිවරුන් නැවත තෝරාගැනීමට හෝ ඡන්ද අයිතිය ඇති ඕනෑම සභා සාමාජිකයකු තෝරා ගැනීමට සභාවට හැකිය.

(vi) සභාපති, තෝරාගත් මීලග සභාපති සහ ආසන්නතම හිටපු සභාපති ධූර හැර ධූර කාලය තුළ ඇබෑර්තු වන යම් ධූරයක්, සභාවේ දැනට සිටින්නා වූ සාමාජිකයන් අතුරින් බහුතර ඡන්දයෙන් අන්තර්කාලීන පදනමක් මත සභාවේ ඊළඟ රැස්වීමේදී පිරවිය යුතුය. එසේ ඇබෑර්තුව පුරවන තැනැත්තා මීළඟ වාර්ෂික මහා සභා රැස්වීමෙන් පසු පළමු සභා රැස්වීමේ අවසානය දක්වා ධූරය දැරිය යුතුය. එසේ ඇති වූ ඇබෑර්තුව මෙම සභා රැස්වීමේදී පිරවිය යුතු අතර ඒ සඳහා 10(උ) වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ කරගත යුතුය.

(ඔ) ආසන්නතම හිටපු සභාපති, ධූර දරන්නෙකු ලෙස නිල බලයෙන් කටයුතු කළ යුතුය. ඒ අනුව, ඔහු තෝරා ගැනීම කිසිදු මහා සභා රැස්වීමක සභාවේ කටයුතුවල කවර හෝ කොටසක් නොවිය යුතුය.

11. **ධූර දරන්නන්ගේ රාජකාරී**

**(අ) සභාපති**

මෙම වගන්තිවල වෙනත් යම් තැනක අන්තර්ගත බලතල හා කර්තව්‍යයන්ට අතිරේකව, සභාපතිවරයා සාමාන්‍යයෙන් මණ්ඩලයේ සියලු රැස්වීම්වල මූලාසනය දැරිය යුතුය. දේශීය හෝ විදේශීය හෝ බාහිර තැනැත්තන් හෝ සංවිධාන සමග ඕනෑම සංවාද මණ්ඩපයක සභාව සිදුකරන කටයුතුවලදී මණ්ඩලය නියෝජනය කිරීමට සහ/හෝ මණ්ඩලයේ කටයුතු සහ ක්‍රියාකාරකම්වලට අදාළ වන්නා වූ යම් කරුණක් පිළිබඳව මණ්ඩලය වෙනුවෙන් කථා කිරීමට ඔහුට හිමිකම තිබිය යුතුය.

**(ආ) තෝරා ගත් මීලග සභාපති**

සභාපතිගේ කර්තව්‍යයන්හිදී තෝරා ගත් මීලග සභාපති ඔහුට සහාය විය යුතු අතර සභාපති නොපැමිණි විටදී සභාවේ සහ කළමනාකරණ මණ්ඩල රැස්වීම්වල මුලසුන දැරිය යුතුය. ඔහු මණ්ඩලයේ කටයුතු අධීක්ෂණය කළ යුතු අතර කළමනාකරණ කමිටුවේ සභාපති විය යුතුය.

**(ඇ) උප සභාපතිවරු**

සභාපතිගේ කර්තව්‍යයන්හිදී උප සභාපතිවරු ඔහුට සහාය විය යුතු අතර කළමනාකරණ මණ්ඩලය විසින් ඔවුනට පවරනු ලබන නිශ්චිත වගකීම් ඉටු කළ යුතුය.

12. **කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම්**

(අ) අවශ්‍ය පරිදි සහ විටදී, යටත් පිරිසෙයින් මසකට වරක්වත් කළමනාකරණ මණ්ඩලය රැස්විය යුතුය.

(ආ) මහා ලේකම්/ ප්‍රධාන විධායක නිලධාරී කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් කැඳවිය යුතුය.

(ඇ) රැස්වීමක් පිළිබඳ යටත් පිරිසෙයින් නිශ්චිත දින හතක ලිඛිත දැන්වීමක් ලබා දිය යුතු අතර, සිදුකිරීමට නියමිත කටයුතු සහ රැස්වීම පවත්වන ස්ථානය දිනය හා වේලාව එම දැන්වීමෙහි නිශ්චිතව දැක්විය යුතුය.

(ඈ) ගණපූරණය කළමනාකරණ මණ්ඩලයේ මුළු සාමාජිකත්වයෙන් සාමාජිකයන් තිදෙනෙකු (3) විය යුතුය.

(ඉ) අන්‍යාකාරයෙන් නිශ්චිතව දක්වා ඇත්තේ නම් මිස, යම් කරුණක් නිශ්චය කළ යුත්තේ පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ සරල බහුතරයෙනි.

(ඊ) සභාපතිගේ හෝ ඔහු පැමිණ නොමැති විට තෝරා ගත් මීලග සභාපතිගේ නියමය මත හෝ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනෙකු විසින් අත්සන් කරන ලද ලිඛිත ඉල්ලීමක් මත විශේෂ රැස්වීමක් කැඳවිය යුතුය. රැස්වීම කැඳවීමේ දැන්වීමෙහි සඳහන් කටයුතු හැර වෙනත් කිසිම කටයුත්තක් එහිදී කිරීම නොකළ යුතුය. එවැනි රැස්වීමක අරමුණ හදිසි යැයි සලකනු ලබන විටදී, යටත් පිරිසෙයින් පැය හතළිස් අටක දැනුම් දීමක් සිදු කළ යුතුය.

(උ) වලංගු හේතුවක් නොමැතිව කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු අනුගාමී රැස්වීම් තුනකට (3) පැමිණ නොමැති විටකදී, කළමනාකරණ මණ්ඩලයේ ඔහුගේ සාමාජිකත්වය ඉබේම අහෝසිවන අතර ඉන් අනතුරුව සභාව කළමනාකරණ කමිටුවට නව සාමාජිකයකු පත් කළ යුතුය.

**13. සභාවේ රැස්වීම්**

(අ) අවශ්‍ය පරිදි සහ විටදී සහ යටත් පිරිසෙයින් මාසයකට වරක්වත් සභාව රැස්විය යුතුය.

(ආ) මහා ලේකම්/ ප්‍රධාන විධායක නිලධාරී සභාවේ රැස්වීම් කැඳවිය යුතුය.

(ඇ) රැස්වීමක් පිළිබඳව යටත් පිරිසෙන් නිශ්චිත දින හතක ලිඛිත දැන්වීමක් ලබා දිය යුතු අතර, සිදු කිරීමට නියමිත කටයුතු සහ රැස්වීම පවත්වන ස්ථානය දිනය හා වේලාව එම දැන්වීමෙහි නිශ්චිතව දැක්විය යුතුය.

(ඈ) ගණපූරණය සභාවේ මුළු සාමාජිකත්වයෙන් සාමාජිකයන්ගෙන් පහෙන් එකක් (1/5) විය යුතුය.

(ඉ) අන්‍යාකාරයෙන් නිශ්චිතව දක්වා ඇත්තේ නම් මිස, යම් කරුණක් නිශ්චය කළ යුත්තේ පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ සරල බහුතරයෙනි.

(ඊ) සභාපතිගේ හෝ ඔහු පැමිණ නොමැති විට තෝරාගත් මීලග සභාපතිගේ නියමය මත හෝ සභාවේ සාමාජිකයන් තිදෙනෙකු විසින් අත්සන් කරන ලද ලිඛිත ඉල්ලීමක් මත සභාවේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතුය. රැස්වීම කැඳවීමේ දැන්වීමෙහි සඳහන් කටයුතු හැර වෙනත් කිසිම කටයුත්තක් එහිදී කිරීම නොකළ යුතුය. එවැනි රැස්වීමක අරමුණ හදිසි යැයි සලකනු ලබන විටදී, යටත් පිරිසෙයින් පැය හතළිස් අටක දැනුම් දීමක් සිදු කළ යුතුය.

(උ) වලංගු හේතුවක් නොමැතිව සභාවේ සාමාජිකයකු අනුගාමී රැස්වීම් තුනකට පැමිණ නොමැති විටකදී, සභාවේ ඔහුගේ සාමාජිකත්වය ඉබේම අහෝසිවන අතර සභාව ඉන් අනතුරුව සභාවට නව සාමාජිකයකු පත් කළ යුතුය.

**14. මහා සභා රැස්වීම්**

**(අ) වාර්ෂික මහා සභා රැස්වීම**

(i) මණ්ඩලය සෑම වර්ෂයකදීම වෙනත් යම් මහා සභා රැස්වීම්වලට අමතරව, සිය වාර්ෂික මහා සභා රැස්වීම ලෙස මහා සභා රැස්වීමක් පැවැත්විය යුතු අතර එය කැඳවන දැන්වීමෙහි ඒ රැස්වීම එවන් රැස්වීමක් බව නිශ්චිතව දැක්විය යුතුය. මූල්‍ය වර්ෂය අවසන් වී මාස හයක් තුළ සභාව විසින් නිර්ණය කරන පරිදි එක් එක් ලිත් වර්ෂයේ යම් දිනයක වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතුය.

(ii) පහත සඳහන් කාර්යයන් සඳහා වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතුය.

(අ) සභාවේ වාර්තාව ලබා ගැනීම
(ආ) පෙර මූල්‍ය වර්ෂය සඳහා විගණිත ගිණුම් ප්‍රකාශ සහ ශේෂ පත්‍රය ලබා ගැනීම
(ඇ) ව්‍යවස්ථාපිත නියෝජිතායතන සාමාජිකයන් සඳහා නියෝජිතයන් තෝරාගැනීම
(ඈ) සංස්ථාපිත සාමාජිකයන් සඳහා නියෝජිතයන් තෝරාගැනීම
(ඉ) විදේශීය සංස්ථාපිත සාමාජිකයන් සඳහා නියෝජිතයන් තෝරාගැනීම
(ඊ) සු.ම.ප. ව්‍යවසායක සාමාජිකයන් සඳහා නියෝජිතයන් තෝරාගැනීම
(උ) තනි පුද්ගල සාමාජිකයන් සඳහා නියෝජිතයන් තෝරා ගැනීම
(ඌ) විගණකවරුන් පත්කිරීම
(එ) නිසි පරිදි දැනුම් දිය යුතු වෙනත් යම් කටයුත්තක්

(iii) වාර්ෂික මහා සභා රැස්වීම කැඳවන දැන්වීම සමග, සභාව පහත දැක්වෙන ලේඛන සාමාජිකයන් වෙත යැවිය යුතුය.

(අ) සභාවට තෝරා ගැනීම සඳහා ව්‍යවස්ථාපිත නියෝජිතායතන සාමාජිකයන්, සංස්ථාපිත සාමාජිකයන්, විදේශීය සංස්ථාපිත සාමාජිකයන්, සු.ම.ප. ව්‍යවසායක සාමාජිකයන් සහ තනි පුද්ගල සාමාජිකයන් විසින් නම් කරනු ලැබූ තැනැත්තන්ගේ නම්.

(ආ) සභාපති, ආසන්නතම අතීත සභාපති සහ තෝරා ගත් මීලග සභාපතිගේ නම්
(ඇ) පූර්ව මුදල් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සහ විගණිත ගිණුම්

**(ආ) අති විශේෂ මහා සභා රැස්වීම්**

(i) වාර්ෂික මහා සභා රැස්වීම හැර අනෙකුත් සියලු මහා සභා රැස්වීම් අති විශේෂ මහා සභා රැස්වීම් ලෙස හැඳින්විය යුතුය.

(ii) සභාපතිගේ හෝ සභාවේ නියෝගය මත හෝ නාම ලේඛනයේ සිටින සාමාජිකයන්ගෙන් දහයෙන් එකකට (1/10) නොඅඩු සංඛ්‍යාවක් සිදුකරන ලිඛිත ඉල්ලීමක් මත අති විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය යුතුය.

(ඇ) යම් වාර්ෂික මහා සභා රැස්වීමකදී හෝ අති විශේෂ මහා සභා රැස්වීමකදි නිසි පරිදි දැනුම් දී නොමැති කිසිදු කටයුත්තක් සලකා නොබැලිය යුතුය.

**(ඈ) මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය**

යටත් පිරිසෙයින් දින විසි එකක (21) ලිඛිත දනුම් දීමකින් වාර්ෂික මහා සභා රැස්වීම කැඳවනු ලැබිය යුතුය. අති විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය යුත්තේ යටත් පිරිසෙයින් දින දහ හතරක (14) ලිඛිත දැනුම් දීමක් මගිනි. එම දැනුම් දීමට එම දැන්වීම යවනු ලබන හෝ යවනු ලැබූයේ යැයි සලකන දිනය සහ එය ලබා දෙනු ලබන දිනය අයත් නොවන අතර රැස්වීමේ ස්ථානය, දිනය සහ වේලාව එහි නිශ්චිතව දැක්විය යුතු අතර විශේෂ කටයුත්තක් සම්බන්ධයෙන් වන විට, මෙහි මින් මතු සඳහන් කරනු ලබන ආකාරයෙන් හෝ ව්‍යවස්ථාව යටතේ මණ්ඩලයෙන් එවැනි දැන්වීමක් ලැබීමට හිමිකම් ඇති යම් තැනැත්තන්ට, මණ්ඩලය විසින් මහා සභා රැස්වීම්වලදී නිර්දේශ කිරීමට ඉඩ ඇති වෙනත් යම් කවර හෝ ආකාරයක් වේ නම් ඒ ආකාරයෙන් එම කටයුත්තේ සාමාන්‍ය ස්වභාවය දැනුම් දිය යුතුය. විධිමත් පරිදි දැනුම්දීම සිදු කර ඇත්නම්, වාර්ෂික මහා සභාවේදී විශේෂ යෝජනා සම්මතයක් සම්මත කළ හැකිය.

එසේ වුවද, මණ්ඩලයේ රැස්වීමක් මෙම වගන්තියේ නිශ්චිතව සඳහන් කාල සීමාවට වඩා අඩු කාලයක දැන්වීමකින් කැඳවනු ලැබූව ද, මණ්ඩලයේ රැස්වීමක් විධිමත් ලෙස කැඳවනු ලැබූ බවට-

(i) වාර්ෂික මහා සභා රැස්වීම ලෙස කැඳවනු ලැබූ රැස්වීමක් සම්බන්ධයෙන් වන විට, තම නියෝජිතයන් මගින් ඒ රැස්වීමට පැමිණ ඡන්දය දීමට හිමිකම නාම ලේඛනයේ සිටින සියලුම සාමාජිකයන්ඃ සහ

(ii) වෙනත් යම් රැස්වීමක් සම්බන්ධයෙන් වන විට, රැස්වීමට පැමිණ ඡන්දය දීමට අයිතිවාසිකම ලැබෙන, නාමලේඛනයේ සිටින සාමාජිකයන්ගෙන් සියයට අනූපහකට නොඅඩු පිරිසක් නියෝජනය කරමින් බහුතරය වන්නා වූ නාම ලේඛනයේ සිටින සාමාජිකයන් විසින් එසේ එකඟවනු ලැබුවහොත්, ඒ රැස්වීම විධිමත් ලෙස කැඳවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

දැන්වීමක් ලැබීමට හිමිකම ඇති යම් තැනැත්තකුටඅහඹු ප්‍රමාද දෝෂයකින් රැස්වීම පිළිබඳ දැන්වීම දීමට නොහැකිවීම හෝ ඔහු වෙත දැන්වීම නොලැබීම නිසාවෙන් එම රැස්වීමේ කටයුතු අවලංගු නොවිය යුත්තේය.

(ඈ) මණ්ඩලය යම් සාමාජිකයකුට පුද්ගලිකව හෝ ඔහුගේ ලියාපදිංචි ලිපිනයට තැපෑලෙන් හෝ (ඔහුට ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි ලිපිනයක් නොමැති නම්) ඔහු වෙත දැනුම්දීම සිදුකිරීම සඳහා ඔහු විසින් මණ්ඩලයට සපයා ඇති ශ්‍රී ලංකාවේ යම් ලිපිනයක් වේ නම් එම ලිපිනයට තැපෑලෙන් යැවීම මගින් හෝ විද්‍යුත් තැපෑලෙන් යැවීම මගින් දැනුම් දීම සිදු කළ හැකිය. දැනුම්දීමක් තැපෑලෙන් යවන අවස්ථාවක දී, දැනුම්දීම අඩංගු ලිපිය නිසි ලෙස ආමන්ත්‍රණය කිරීම, පූර්ව ගෙවීම සහ තැපැල් කිරීම මගින් දැනුම්දීම භාර දීම සිදුකළා සේ ද, දැනුම්දීම රැස්වීමක් සම්බන්ධයෙන් වන විට දැනුම් දීම අඩංගු ලිපිය තැපැල් කිරීමෙන් පැය විසි හතරක් අවසානයේ දැනුම්දීම භාර දීම සිදු කලාසේද සහ වෙනත් කවර හෝ අවස්ථාවකදී සාමාන්‍ය තැපෑලෙන් ලිපිය බෙදා දෙනු ලබන වේලාවේදී ද බාර දුන් බවට සැලකිය යුතුය.

(ඉ) මහා සභා රැස්වීමකදී ඡන්දය දීම

සභාවට තෝරා ගනු ලැබූ නියෝජිතයන් ඇතුලුව සෑම සාමාජිකයකුටම එක් ඡන්දයක් තිබිය යුතු අතර යම් මහා සභා රැස්වීමකදී එම සාමාජිකයා නියෝජනය කිරීමට සහ ඡන්දය ප්‍රකාශ කිරීමට සභාව විසින් එම කාර්යය සඳහා නිර්දේශ කරනු ලැබූ ආකාරයෙන් එක් (1) ප්‍රතියුක්තයකු පත් කිරීමට හිමිකම තිබිය යුතුය. එක් එක් ප්‍රතියුක්ත දරන්නන්ට ඒ මහා සභා රැස්වීමේදී කථා කිරීමට හිමකම ඇති අතර පැමිණ සිටින එක් එක් ප්‍රතියුක්ත දරන්නාට එක් ඡන්දයකට හිමිකම තිබිය යුතය.

එසේ වුවද, යම් සාමාජිකයකු ප්‍රවර්තන වසරේ මාර්තු මස 31 දිනට පෙර වාර්ෂික දායක ගාස්තුව ගෙවා ඇත්තේ නම් මිස වාර්ෂික මහා සභා රැස්වීමක දී ඡන්දය දීමට හෝ සභාවට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට තෝරා පත් කර ගනු ලැබීමට කිසිදු සාමාජිකයකු සුදුසුකම් නොලබන්නේය.

**(ඒ) ගනපූරණය**

යම් මහා සභා රැස්වීමකදී, රැස්වීම එහි කටයුතු දක්වා ඉදිරියට යන අවස්ථාව වන විට සාමාජිකයන්ගේ ගණපූරණය නොමැත්තේ නම් කිසිදු කටයුත්තක් නොකළ යුතුය. මෙහි අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇත්තේ නම් මිස, පුද්ගලිකව හෝ ප්‍රතියුක්ත දරන්නකු මගින් පැමිණ සිටින, වාර්ෂික දායක මුදල ගෙවා ඇති සහ ඡන්දය දීමට හිමි කම ඇති නාම ලේඛනයේ සිටින මුළු සාමාජික සංඛ්‍යාවෙන් 30%ක් ගණපූරණය සංස්ථාපනය කරන්නේය.

ගන පූරණය නොමැති අවස්ථාවක දී, රැස්වීම විනාඩි 15ක් සඳහා කල් තබා පැමිණි සිටින්නා වූ සාමාජිකයන්ගෙන් නැවත කැඳවිය යුතු අතර එහිදී සංඛ්‍යාවෙන් 7 දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් ගණපූරණය සංස්ථාපනය කරන්නේ ය.

(ඞ) සාමාජිකයන්ගේ ඉල්ලීම මත කැඳවනු ලැබූ රැස්වීමක් සම්බන්ධයෙන් වන විට, සිය ප්‍රතියුක්තයන් මගින් පැමිණ සිටින සහ ඡන්දය දීමට හිමිකම ඇති නාමලේඛනයේ සිටින මුළු සාමාජික සංඛ්‍යාවෙන් 1/3 ක් ගණපූරණය සංස්ථාපනය කළ යුතුය. රැස්වීම සඳහා නියම කළ වේලාවෙන් පැය භාගයක් තුළ ගණපූරණය නොමැත්තේ නම්, රැස්වීම විසුරුවා හැරිය යුතුය.

වෙනත් යම් රැස්වීමක් සම්බන්ධයෙන් වන විට, රැස්වීමට පසුව එළඹෙන සතියේ එම දිනයේ ම එම වේලාවේම සහ ස්ථානයේදීම හෝ සභාව විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් දිනක, වේලාවක හා ස්ථානයක පැවැත්වීම සඳහා රැස්වීම කල් තැබිය යුතු අතර කල් තැබූ රැස්වීමේදී, රැස්වීම සඳහා නියමිත වේලාවෙන් පසු පැය භාගයක් ඇතුළත ගණපූරණයක් ඇති නොවුවහොත්, පැමිණ ඇති සාමාජිකයන්ගෙන් ගණපූරණයක් ඇතිවන සේ සලකනු ලැබිය යුතුය.

**(ඟ) රැස්වීමේ සභාපති**

(i) සභාවේ සභාපති සහ ඔහු පැමිණ නොමැති විටදී තෝරා ගෙන ඇති මීලග සභාපති සහ ඔහු පැමිණ නොමැති විටදී අනෙකුත් උප සභාපතිවරුන් අතුරින් එක් අයකු මණ්ඩලයේ සෑම මහා සභා රැස්වීමකම මුලසුන දැරිය යුතුය. ඉහත සඳහන් ධූර දරන්නන් කිසිවකු හෝ පැමිණ නොමැති නම්, මහා ලේකම්/ප්‍රධාන විධායක නිලධාරියා සභාපති ලෙස මූලාසනය දැරිය යුතුය. එවැනි සභාපතිවරයකු නොමැති අවස්ථාවකදී හෝ රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවෙන් මිනිත්තු පහළොවක් ඇතුළත සභාපති, තෝරා ගත් මීලග සභාපති හෝ උප සභාපතිවරුන් කිසිවකු හෝ මහා ලේකම්/ප්‍රධාන විධායක නිලධාරි පැමිණ නොසිටිය හොත් හෝ සභාපති ලෙස කටයුතු කිරීමට අකැමැත්තේ නම්, සභාවේ පැමිණ සිටින සාමාජිකයන්, රැස්වීමේ සභාපති වශයෙන් පැමිණ ඇති සාමාජිකයන්ගෙන් අයකු තෝරා ගනු ලැබිය හැකිය.

(ii) ගණපූරණයක් ඇති යම් මහා සභා රැස්වීමක සභාපතිවරයා විසින්, පැමිණ සිටින සාමාජිකයන්ගේ කැමැත්ත ඇතිව, (සහ රැස්වීම විසින් එසේ කරන ලෙස නියම කරනු ලැබුවහොත්) රැස්වීම කලින් කල හා ස්ථානයෙන් ස්ථානයට අඩාලව කල් තබනු ලැබිය හැකිය ; එහෙත් ඒ අඩාලව කල් තැබීම සිදුවූයේ යම් රැස්වීමක දී ද ඒ රැස්වීමේ දී අවසන් නොකොට ඉතිරි වූ කටයුතු හැර වෙනත් කිසිම කටයුත්තක්, අඩාලව කල් තබනු ලැබූ යම් රැස්වීමක දී කරනු නොලැබිය යුතුය. රැස්වීමක් දින තිහකට හො වැඩි කාලයකට අඩාලව කල් තබනු ලැබූ විටදී, නව රැස්වීමක් සම්න්ධයෙන් වන සේ සලකා අඩාලව කල් තැබූ රැස්වීම පිළිබඳ දැනුම්දීම කළ යුතුය. ඉහත කී පරිදි හැරුණු විට, අඩාලව කල් තැබීම පිළිබඳව හෝ අඩාලව කල් තැබූ යම් රැස්වීමක කිරීමට නියමිතව තිබූ කටයුතු පිළිබඳව දැනුම් දීම අවශ්‍ය නොවිය යුතුය.

(iii) අන්‍යාකාරයෙන් නිශ්චිතව සඳහන් කර ඇත්තේ නම් මිස, රැස්වීමේදී ඡන්දය සඳහා ඉදිරිපත් කරනු ලැබූ යෝජනා සම්මතයක් සරල බහුතරයකින් අත් එසවීමෙන් තීරණය කරනු ලැබිය යුතුය.

(iv) යෝජනා සම්මතයක් සම්මත වී ඇති බවට හෝ ඒකමතිකව හෝ යම් නිශ්චිත බහුතරයකින් සම්මත වී ඇති බවට හෝ පරාජය වී ඇති බවට වන සභාපතිවරයාගේ ප්‍රකාශනයක් සහ මණ්ඩලයේ රැස්වීම් කටයුතුවල වාර්තා අඩංගු පොතෙහි ඒ සම්බන්ධයෙන් වන සටහනක්, එවැනි යෝජනා සම්මතයකට පක්ෂව හෝ එරෙහිව වාර්තා වූ ඡන්දවල සංඛ්‍යාව හෝ අනුපාතය පිළිබඳ තහවුරුවක් නොමැතිව අවසානාත්මක සාක්ෂිය විය යුතුය.

(v) ඡන්ද සමාන වන අවස්ථාවකදී, රැස්වීමේ සභාපතිවරයාට දෙවන හෝ තීරක ඡන්දයක් තිබිය යුතුය.

(vi) මහා සභා රැස්වීමක් පිළිබඳ දැනුම් දීමක් ලැබීමට සහ සහභාගි වීම සහ ඡන්දය දීමට හිමිකම ඇති තත් කාලයේ නාම ලේඛනයේ සිටින සියලු සාමාජිකයන් විසින් අත්සන් තබනු ලැබූ යෝජනා සම්මතයක්, විධිමත්ව කැඳවා පවත්වනු ලැබූ මණ්ඩලයේ මහා සභා රැස්වීමකදී සම්මත වූවා සේම වලංගු හා බලාත්මක වන්නේය.

15. ස්ථාවර කමිටු

(අ) සභාව විසින් තීරණය කරනු ලබන පරිදි, මූලිකවම වෙන් කරන ලද විෂයයන් භාරව සිටීම පිණිස මණ්ඩලයේ සාමාජිකයන්ගේ නියෝජිතයන්ගෙන් හෝ තනි පුද්ගල සාමාජිකයන් සම්බන්ධයෙන් වන විටදී එම සාමාජිකයන්ගෙන් අනන්‍ය වශයෙන් සමන්විත ස්ථාවර කමිටු සභාව විසින් පත් කළ හැකිය.

(ආ) උපදෙස් සහ උපදේශනය සඳහා මණ්ඩලයෙන් පරිබාහිර තැනැත්තකුට ස්ථාවර කමිටුව ආරාධනා කළ හැකිය.

(ඇ) ස්ථාවර කමිටුවක් සභාවේ සාමාජිකයන් අතුරින් වාර්ෂිකව එහි සභාපති සහ කැඳවුම්කරු තෝරා ගත යුතු අතර එලෙස තෝරා ගැනීම සභාවට සන්නිවේදනය කළ යුතුය.

(ඈ) තම විෂය පථයට අයත් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් ස්ථාවර කමිටුව, කළමනාකරණ මණ්ඩලයට, එහි සභාපතිවරයා හෝ මහා ලේකම්/ ප්‍රධාන විධායක නිලධාරී මගින් වාර්තා කළ යුතුය.

(ඉ) විශේෂ හදිසි කරුණකදී, ස්ථාවර කමිටුවේ සභාපති, ඔහු විසින්ම කළමනාකරණ මණ්ඩලයේ රැස්වීමක් සඳහා එවැනි වාර්තාවක් සකස් කළ හැකිය.

(ඊ) අවශ්‍ය විටදී සහ අවශ්‍ය පරිදි සහ යටත් පිරිසෙයින් මාසයකට වරක් ස්ථාවර කමිටුව රැස්විය යුතුය.

(උ) එක් එක් ස්ථාවර කමිටුවේ කැඳවුම්කරු, එහි සභාපති විසින් උපදෙස් දෙනු ලබන පරිදි ස්ථාවර කමිටුවේ රැස්වීම් කැඳවිය යුතුය.

(ඌ) රැස්වීම් පිළිබඳ දින හතක ලිඛිත දැනුම් දීමක් සිදුකළ යුතු අතර රැස්වීමේදී සිදුකිරීමට නියමිත කටයුතු, සහ එහි ස්ථානය, දිනය සහ වේලාව දැන්වීමේ නිශ්චිතව දැක්විය යුතුය. පැය හතළිස් අටක දැනුම්දීමක් මගින් හදිසි රැස්වීමක් කැඳවිය හැකිය.

(එ) ස්ථාවර කමිටුවක් එහි ගණපූරණය නියම කළ යුතුය.

(ඒ) යම් කරුණක් පැමිණි ඡන්දය දෙන සාමාජිකයන්ගේ සරල බහුතරයෙන් තීරණය කළ යුතුය.

(ඔ) ඡන්ද සමාන වන අවස්ථාවක දී, සභාපතිවරයාට තීරක ඡන්දයක් තිබිය යුතුය.

16. ගිණුම්

**(අ) මහා ලේකම්/ප්‍රධාන විධායක නිලධාරී- මුදල්**

(i) මණ්ඩලයට සියලු මුදල් ලැබීම් හා මුදල් වියදම් කිරීම් සහ ඒ මුදල් ලැබුණේ සහ වියදම් කරන ලද්දේ කුමන කාරණා සම්බන්ධයෙන් ද ;
(ii) මණ්ඩලය විසින් සිදු කළ සියලු විකුණුම් හා මිලදී ගැනීම් ; සහ
(iii) මණ්ඩලයේ වත්කම් හා බැරකම්වලට අදාළව,

නිසි පරිදි ගිණුම් පොත් පවත්වා ගෙන යාමට කටයුතු සැලැස්විය යුතුය.

(ආ) විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන විගණක විසින් මණ්ඩලයේ ගිණුම් විගණනය කරනු ලබන බවට සහ මූල්‍ය වර්ෂය අවසාන වී මාස හයක් (6) ඇතුළත වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට හැකිවන පරිදි අවසාන විගණන වාර්තාව කල් වේලා ඇතිව ලබා දෙන බවට මහා ලේකම්/ප්‍රධාන විධායක නිලධාරී වග බලා ගත යුතුය.

(ඇ) ගිණුම් පොත් මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලයේ හෝ සභාව විසින් සුදුසු යැයි සිතන වෙනත් යම් ස්ථානයක හෝ ස්ථානවල තබා ගත යුතු අතර සැමවිටම සභාවේ සාමාජිකයන්ට පරීක්ෂා කිරීමට විවෘත විය යුතුය.

(ඈ) සභාවේ සාමාජිකයන් නොවන්නා වූ, සාමාජිකයන්ගේ නියෝජිතයන්ගේ පරීක්ෂාව සඳහා මණ්ලයේ ගිණුම් හෝ පොත් හෝ ඒවායින් කවරක් හෝ විවෘතව තැබිය යුත්තේද, එසේ තබන්නේ නම් කොපමණ ප්‍රමාණයකට සහ කවර වේලාවන් හා ස්ථානයන්හිදී ද සහ කවර කොන්දේසි හා රෙගුලාසි යටතේ ද යන්න සභාව කලින් කල නිශ්චය කළ යුතු අතර සභාවේ සාමාජිකයකු නොවන සමාජිකයන්ගේ නියෝජිතයන්ට පනත මගින් හෝ මහා සභා රැස්වීමකදී සභාව විසින් හෝ මණ්ඩලය විසින් හෝ බලය පවරා ඇත්තේ නම් මිස මණ්ඩලයේ කිසිදු ගිණුමක් හෝ පොතක් හෝ ලේඛනයක් පරීක්ෂා කිරීමට අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

(ඉ) පූර්වගාමී මුදල් වර්ෂය සඳහා මණ්ඩලයේ ලාභ හා පාඩු ගිණුම් සහ ශේෂ පත්‍ර සකස් කිරීමට හා මහා සභා රැස්වීමේදී මණ්ඩලය ඉදිරියේ තැබීමට මහා ලේකම්/ ප්‍රධාන විධායක නිලධාරියා විසින් කටයුතු සැලැස්විය යුතුය.

(ඊ) විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පිටපත් සමගින් මහා සභා රැස්වීමේදී මණ්ඩලය හමුවේ තැබිය යුතු සෑම ශේෂ පත්‍රයකම පිටපතක් (නීතියට අනුව ඊට ඇමිණීමට නියම කරනු ලැබූ සෑම ලියවිල්ලක්ම ඇතුළුව) මණ්ඩලයේ සෑම සාමාජිකයකුටම සහ සෑම ණයකර දරන්නකුටම සහ මෙම වගන්ති යටතේ මණ්ඩලයේ දැනුම්දීමක් ලැබීමට හිමි කම ඇති සෑම තැනැත්කුටම හා වෙනත් යම් තැනැත්තකුට, රැස්වීමේ දිනයට පෙර දින විසි එකක (21) නොඅඩු කාලයක් තුළ යැවිය යුතුය: එසේ වුවද, මණ්ඩලය ලිපිනය නොදන්නා යම් තැනැත්තෙකුට මෙම ලේඛනවල පිටපත් යවනු ලැබීම මෙම වගන්තියෙන් නියම නොකරන නමුත් මෙම ලේඛන යවා නොමැති කවර හෝ සාමාජිකයන්ට කාර්යාලයට අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් පිටපතක් නොමිලයේ ලබා ගැනීමට හිමිකම තිබිය යුතුය.

(උ) යටත් පිරිසෙයින් අවුරුද්දකට වරක්, මණ්ඩලයේ ගිණුම් පරීක්ෂා කර බලනු ලැබිය යුතු අතර ලාභ සහ අලාභ ගිණුමේ සහ ශේෂ පත්‍රයේ නිවැරැදිභාවය විගණකවරුන් එක් අයකු හෝ වැඩි ගණනක් විසින් තහවුරු කළ යුතුය.

**17. විගණකවරු**

(අ) විගණකවරුන් සංඛ්‍යාව සහ විගණක හෝ විගණකවරුන්ගේ ධූරය පිරවිය යුතු තැනැත්තා හෝ තැනැත්තන් විගණකාධිපතිවරයා විසින් තීරණය කරනු ලැබිය යුතුය. එසේම, විගණකවරුන්ගේ පාරිශ්‍රමිකය සහ ඔහුගේ හෝ ඔවුන්ගේ ධූර කාලය විගණකාධිපතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතුය.

(ආ) අසතුටුදායක කාර්යසාධනය හේතුවෙන් වෙනත් විගණකයකු හෝ විගණකවරුන් පත්කරන ලෙස ඉල්ලමින් වාර්ෂික මහා සභා රැස්වීමේදී යෝජනා සම්මතයක් සම්මත වූ විටදී, විගණක හෝ විගණකවරුන් ලෙස වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් පත් කරන ලෙස මණ්ඩලය විගණකාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කළ යුතුය.

(ඇ) ඕනෑම මහා සභා රැස්වීමකට පැමිණ සිටීමට සහ යම් මහා සභා රැස්වීමකට අදාළව යම් සාමාජිකයකු හිමිකම් ලබන දැන්වීම් හා නිවේදන ලැබීමට සහ විගණක හෝ විගණකවරුන් ලෙස තමාට අදාළ රැස්වීමේ කටයුතුවල යම් කොටසක් සම්බන්ධයෙන් කරුණු දක්වා සිටීමට විගණකට හෝ විගණකවරුන්ට හිමිකම තිබිය යුතුය.

(ඈ) මණ්ඩලයේ සියලු ගිණුම්, පොත් සහ ලේඛන කවරක් හෝ විගණනයේ කාර්යය සඳහා විගණක හෝ විගණකවරුන් විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා සෑම කල්හිම විවෘත විය යුතුය.

**18. මහා ලේකම්/ ප්‍රධාන විධායක නිලධාරි**

තමන් සුදුසු යැයි සිතන යම් නියම හා කොන්දේසි මත මහා ලේකම්වරයකු/ ප්‍රධාන විධායක නිලධාරියකු පත්කිරීමට සහ එම තැනැත්තාගේ සේවාව අවසන් කිරීමට සභාවට හැකිය. මහා ලේකම්වරයා/ විධායක නිලධාරියා මණ්ඩලයේ සාමාන්‍ය පරිපාලනය සහ කළමනාකරණය සඳහා වගකිව යුතු අතර මණ්ඩලයේ විධායක කාර්ය මණ්ඩලයේ ප්‍රධානියා විය යුතුය. මහා ලේකම්වරයා/ ප්‍රධාන විධායක නිලධාරියා කළමනාකරණ මණ්ඩලයට සහ කළමනාකරණ මණ්ඩලය මගින් සභාවට උත්තර දීමට බැඳී සිටිය යුතුය.

**19. පොදු මුද්‍රාව**

(අ) මණ්ඩලයේ පොදු මුද්‍රාව සභාව මණ්ඩලය විසින් තීරණය කොට සාදනු ලැබිය යුතු අතර මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ආකාරයට එය වෙනස් කරනු ලැබිය හැකිය.

(ආ) මණ්ඩලයේ පොදු මුද්‍රාව මහා ලේකම්/ ප්‍රධාන විධායක නිලධාරි භාරයේ තිබිය යුතුය.

(ඇ) මණ්ඩලයේ සභාපති හෝ තෝරා ගත් මීළඟ සභාපති සහ මහා ලේකම්/ ප්‍රධාන විධායක නිලධාරියා හෝ තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් අත්සන් තබන කළමනාකරණ මණ්ඩලයේ යම් සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරියේ හැර පොදු මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර එසේ අත්සන් තැබීම සාක්ෂිකරුවකු ලෙස අත්සන් තබන යම් තැනැත්තකුගෙන් පරිබාහිර විය යුතුය.

**20. සමථකරණය**

සමථකරණය සඳහා යම් ආරවුලක් මණ්ඩලයට යොමු කරනු ලැබ ඇති විටදී, සභාව විසින් පත්කරනු ලැබූ කමිටුවක්, සභාව විසින් එම කාර්යය සඳහා සකසනු ලැබිය හැකි රීති ප්‍රකාරව තීරණයක් ලබා දිය හැකිය.

**21. තහනම් කරනු ලැබූ කාරණා පිළිබඳව සාකච්ඡා වළක්වාලීම කිරීම**

මණ්ඩලයේ හෝ සභාවේ හෝ යම් ස්ථාවර කමිටුවක හෝ යම් රැස්වීමක සභාපතිවරයා, තම මතයට අනුව දේශපාලනික අදාළත්වයක් ඇති කවර හෝ කරුණක් සලකා බැලීමෙන් හෝ සාකච්ඡා කිරීමෙන් වැළැක්විය යුතුය.

**22. රීති සඳහා එකතු කිරීම්, වෙනස් කිරීම් සහ සංශෝධන**

සභාව විසින් පළමුව එකඟ වූයේ නම් මිස, තත් කාලයේ බල පැවැත්වෙන මෙම රීති වලට යම් එකතු කිරීමක්, වෙනස් කිරීමක් හෝ සංශෝධනයක් කිරීම සිදු නොකළ යුතුය. කෙසේ වෙතත්, යම් එකතු කිරීමක්, වෙනස් කිරීමක් හෝ සංශෝධනයක් බලාත්මක වීමට මහා සභා රැස්වීම්වලදී පැමිණ ඡන්දය දීමට හිමිකම ඇති සහ එහිදී ඡන්දය ප්‍රකාශ කරන සාමාජිකයන්ගේ ප්‍රතියුක්තකයන් සහ තනි පුද්ගල සාමාජිකයන් සම්බන්ධයෙන් වන විට, ඔවුන් හෝ ඔවුන්ගේ ප්‍රතියුක්තයන් තුනෙන් දෙකක් විසින් වාර්ෂික මහා සභා රැස්වීමකදී හෝ අති විශේෂ මහා සභා රැස්වීමකදී සම්මත කරනු ලැබූ යෝජනා සම්මතයකින් පිළිගත යුතුය.

**23. විසුරුවා හැරීම**

මණ්ඩලය වසා දැමීමේ දී හෝ විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත්, ඒ දේපළ මණ්ඩලයේ සාමාජිකයන් අතර ගෙවනු හෝ බෙදනු නොලැබිය යුතු අතර, මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද, මණ්ඩලයේ සමාජිකයන් විසින් විසුරුවා හරිනු ලබන අවස්ථාවේදී හෝ ඊට පෙරාතුවම තීරණය කිරීමට නියමිත වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට සහ ඉහත කී විධිවිධානය බලාත්මක කිරීමට නොහැකිවන විටකදී යම් පුණ්‍යාධාර අරමුණකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතුය.

**24. හානිපූරණය**

මණ්ඩලය වෙනුවෙන් තම රාජකාරි විධිමත්ව හා සාධාරණව ඉටු කිරීමේදී තමන් විසින් කරනු ලැබූ යම් ක්‍රියාවක් සඳහා සභාවේ යම් සාමාජිකයකු හෝ සාමාජිකයන්ට හෝ ධුර දරන්නන්ට එරෙහිව නඩු පැවරීමත්, පවරා පවත්වා ගෙන යාම හෝ නෛතික ක්‍රියාමාර්ගයන් ආරම්භ කරනු ලැබුවහොත්, ඒ තැනැත්තා හෝ තැනැත්තන් වෙනුවෙන් විත්තිවාචක සිදු කළ යුතු අතර එම නඩුවේ, පවරා පවත්වා ගෙන යාමත් හෝ නෛතික ක්‍රියාමාර්ගයන් සිවිල් නඩුවේ ප්‍රතිඵලයක වන්නා වූ සියලු හානි, පිරිවැය සහ වියදම් මණ්ඩලයේ පිරිවැයෙන් හානිපූරණය කරනු ලැබිය යුතු අතර කලින් කල
මණ්ඩලය විසින් නියම කරනු ලබන පරිදි එම කාර්යය සඳහා මණ්ඩලයේ දේපළ සහ අරමුදල් යොදා ගනු ලැබිය හැකිය.

**25. ලේඛනය**

(i) එක් එක් සාමාජිකයාගේ නම හා ලිපිනය
(ii) සාමාජිකයාගේ නම නාම ලේඛනයේ සටහන් කරනු ලැබූ දිනය; සහ
(iii) සාමාජිකයකු, සාමාජිකයකු වීම අවසන් වූ දිනය සහ සභාව විසින් තීරණය කරනු ලැබූ පරිදි වෙනත් යම් තොරතුරු සපයන්නා වූ ලේඛනයක් පවත්වා ගත යුතුය

**26. ලේඛන සත්‍ය බව සහතික කිරීම**

මෙම රීතිවල අන්‍යාකාරයෙන් නිශ්චිතව දක්වා ඇත්තේ නම් මිස, මණ්ඩලයට බලපාන්නා වූ යම් ලේඛන සහ මණ්ඩලය හෝ සභාව විසින් සම්මත කරනු ලැබූ යම් යෝජනා සම්මතයන් සහ මණ්ඩලයේ කටයුතුවලට අදාළවන්නා වූ යම් පොත්, වාර්තා, ලේඛන සහ ගිණුම් සත්‍ය බව සහතික කිරීමට සහ ඒවායේ පිටපත් සහ ඒවායින් ලබාගත් උධෘත සත්‍ය පිටපත් හෝ උධෘත ලෙස සහතික කිරීමට සභාපතිවරයාට, තෝරා ගත් මීළඟ සභාපතිට සහ මහා ලේකම්වරයාට/ ප්‍රධාන විධායක නිලධාරියාට බලය තිබිය යුතුය.

04 - 40

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.